කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලයකොළඹ , 01

நிதி, திட்டமிடல் அமைச்சு,
செயலகம், கொழும்பு 01

Ministry of Finance
The Secretariat, Colombo 01

මගේ අංකය / எனது இல / My No: DMA/P/2017/8-3

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2017/02/15

කළමනාකරණ විගණන චක්‍රලේඛ 1/2017

සියළු අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු
දෙපාර්තමේන්තු ප්‍රධානීන්, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම්වල සභාපතිවරු

<u>විදේශාධාර පාදක සංවර්ධන ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණන සහාය ලබා ගැනීම</u>

කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 2/2016 හා බැඳේ.

ඒ අනුව ව්‍යාපෘතියක අභ්‍යන්තර විගණකවරයකු ලෙස රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවසායයක ගණකාධිකාරී නිලධාරියකු පත් කෙරෙන විට ඔහුගේ නිත්‍ය තනතුරට අමතරව පූර්ණ කාලීන හෝ අර්ධ කාලීනව එක් ව්‍යාපෘතියක පමණක් අභ්‍යන්තර විගණකවරයකු ලෙස කටයුතු කරන බවට සහතික විය යුතුය.
ව්‍යාපෘතිය සඳහා පත් කෙරෙන යම් අභ්‍යන්තර විගණකවරයකු මඟින් අභ්‍යන්තර විගණන කාර්යය ඉටුකර ගැනීමේ දී එකී ව්‍යාපෘති විගණන කාර්යයේ වගවීම, කාර්යක්ෂමතාව, ඇගයීම හා පසු විපරම් කිරීමේ හැකියාව සහතික කර ගනු වස් මේ සමඟ ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියා කිරීම අවශ්‍ය වේ.

**පොදු කරුණු**

- ව්‍යාපෘති අභ්‍යන්තර විගණක ඒ ඒ මුදල් වර්ෂය ආරම්භ වීමට පෙර වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම මෙහි ඇමුණුම 1 ආකෘතියට අනුකූල වන පරිදි පිළියෙළ කළ යුතු අතර ඒ සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය.
- ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සැලැස්මේ පිටපතක් එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමට පෙර කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.
- අභ්‍යන්තර විගණකවරයා වාර්ෂික විගණන සැලැස්ම පදනම් කර ගනිමින් එක් එක් මාසය සඳහා විගණන වැඩසටහනක් පිළියෙල කර විගණනය ක්‍රියාත්මක කළ යුතු අතර ඊට අදාළ විගණන වාර්තා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට පිටපතක් සහිතව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඉදිරිපත් කළ යුතුය.
- ව්‍යාපෘති අභ්‍යන්තර විගණකවරයා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 5 කෙරේ විශේෂ අවධානය යොමු කරමින් හා ව්‍යාපෘතියේ සියළු අංශ ආවරණය වන ආකාරයෙන් වාර්ෂික විගණන සැලැස්ම හා මාසික විගණන වැඩසටහන් පිළියෙල කළ යුතුය.

කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600, 2484700
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: (9411)2484543
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496
වෙබ් අඩවිය / வெப் சைட் / website: www.treasury.gov.lk

# අභ්‍යන්තර විගණන සැලැස්ම ........... වර්ෂය සඳහා

අමාත්‍යාංශය :

ව්‍යාපෘතියේ නම :

| අනු අංකය | අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් | අභ්‍යන්තර විගණනයට අදාළ අනු ක්‍රියාකාරකම් | විගණනයේ අපේක්ෂිත ඉලක්කයන් | අභ්‍යන්තර විගණන කාලරාමුව | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
| 1 | | | | | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | | | | | |
| 3 | | | | | | | | | | | | | | | |
| 4 | | | | | | | | | | | | | | | |

ඇමුණුම 2

අමාත්‍යාංශය - ........................................................................

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම - ........................ කාර්තුව

ව්‍යපෘතිය - ..........................................................................

ව්‍යාපෘති විගණන නිරීක්ෂණ සම්බන්ධව සාකච්ජා කළ කරුණු

| අංකය | විගණන නිරීක්ෂණ | කමිටු රැස්වීමේ නිර්දේශ |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |